



# එදා මෙදා තුර

හෙන්රි ඩී කුමරප්පෙරුම

සිනුවර සිට




අතීත මිනිසා පසු කාලීනව පා ගමන හැරුණු විට එක්කෝ ගැලක ආධාරයෙන් නැතිනම් ඔටුවන් හෝ බූරුවන් පිට නැගී ගෙන ගමන් කළ ආකාරය අමතක නොනළ යුතුය. සිය ගණන් ගැල් වලින් වන පෙත් පසු කරමින් සිය කටයුතු කරගත් අයුරු එදා දඹදිව කතන්දර හෙළි කරයි. කාන්තාරයේ නෞකාව ලෙසින් හැඳින් වූ ඔටුවා ද එදා මැද පෙරදිග මිනිසා දුර ගමනාන්ත කරා යොමු කළේය. එමෙන් ම හුලවාලි ජනයා තැනින් තැන යෑම සඳහා බූරුවා උපයෝගී කරගති. අශ්වයා ද එවැනි ම සේවයක් සැපයුවෙකි.

> අපගේ දෑස් ඉදිරියේ ඇති සෑම දෙයකින් ම දැකගත හැකි වන දෙයක් ඇත. ඒ මිනිසාගේ ගමන් මග අපූර්වත්වයට පත් කළ කඩයිම් නවීන විද්‍යාවට බොහෝ සෙයින් බරව ඇති බවය.

ගමනට එක් වන අඩුවැඩිය නිසා එම ගමනෙහි සුව පහසුව සැළසෙනු ඇත. ගමනට රැගෙන යන දේත් මග තොටින් අවශ්‍ය වෙලාවට ගනු ලබන දේත් නිසා හිතට කයට කරදරයක් නොදෙන අස්වැසිල්ලක් වනු ඇත. ගමනෙහි දුර දිගෙහි තරම ගමනාන්තය විසින් නිර්ණය කරනු ඇත. එයට අදාළ වන සුව පහසුව ගැන මෙන් ම බාධක උවදුරු ගැන ද කිසියම් හැඟීමක් ඇති විය යුතුය. එයට ළඟා වීමට තෝරා ගන්නා ගමන් මග එදා එක් විදියක් විය. අද තවත් විදියකි හෙට මේ දෙවිදියට ම වඩා වෙනස් එකක් වන්නට බැරි නැති බව උපකල්පනය කිරීම උචිතය.

ඈත ඉතිහාසයෙහි අප දුටුවේ මිනිසා කෙටි අන්තයකට හෝ දුරා න්තයකට දෙපා වාරුවෙන් ගමන් ගත් බවකි. එසේ යාමේදී ගමනට අවශ්‍ය කෑම බීම් ඇතුලු අවශ්‍ය දේ රැගෙන යාමට ඔලගුවක් නැති නම් මල්ලක් කරේ එල්ලා ගෙන ගියහ. එසේ ගමන් කළ මගියකුගේ ඔලගුවට සර්පයෙක් රිංගා ගැනීමේ කතා පුවත අනුව 'ගෙදර ගියොත් අඹු නසී මගසිටියොත් තෝ නසී' යැයි කව්සේකර කාව්‍යයේ සඳහන් වේ. මෙසේ ගමන් ගන්නා ඔවුන්ගේ සුව පහසුව සඳහා සැතපුමක් අවශ්‍ය විය. විඩා සන්සිඳවා ගැන්මට හෝ රැයක් ගත කරලීමට යම් දුරක් ගිය තැන එසේ සැතපීමට ගිම් නිවා ගැන්මට අම්බලමක් හෙවත් මගී නවාතැනක් ඉදිවී තිබුනි.

පැරණි සන්දේශ සාහිත්‍යයේ දැක්වෙන තොරතුරු අතර 'තුරු කඳවුර සැතපෙව අම්බලම කෙරේ' (ගිරා සඳෙස 110.) සන්දේශයක් රැගෙන යන ගිරවාට අම්බලම අසළ ගසක ලැගුම් ගැනීමට වෑත්තෑවේ හිමි උපදෙසක් දෙන්නේ අම්බලමේ නවාතැන් ගත්තවුන් යම් යම් කතාබස් වළ යෙදෙන බැවින් තමන්ට ද පාලුවක් ඇති නොවන නිසාය. සැලළිහිණියේ ද වල් අම්බලම පසු කර යන ලෙස රහල් හිමි සැළලිහිණියාට දන්වති. මාතර සාහිත්‍ය යුගය වර්ණවත් කළ ගජමන් නෝනා දරුවා සොයා ගිය ගමන අවසන් වූයේ නවාතැන් ගත් අම්බලමකදී නයෙක් දෂ්ඨ කිරීමෙනි. රම්බඩ දුර්ග මාර්ගයේ ඉදිව තිබූ අම්බලම මෑතක් වන තුරු ම දක්නට තිබිනි. නව මාර්ග සංවර්ධනය නිසා එය ඉවත්වී ඇත්දැයි නොදනිමි.

මහා කවි කාලිදාස ගැන සිහි වෙන හැම විටක ම ද අම්බලම සිහියට නැගේ. ඒ භෝජ රජුගේ උදහසින් බේරීම සඳහා මගට බැස යෑමේ කතා පුවත නිසයි. එදා රාජ සභාව පිනවමින් කවි කියූ කාලිදාසයන්ගෙන් භෝජ රජු ඉල්ලීමක් කළහ. එනම් 'තමා මියැදුන විට ඒ වෙනුවෙන් කියන කවිය දැන්ම ම කිව යුතුය' යනු ඒ ඉල්ලීමයි. රජුගේ මෙම ඉල්ලීම කෙසේ වත් ඉටු කළ නොහැක්කකි. එය ඉටු නොකිරීම ද රාජ උදහසට කරුණකි. මෙයින් ගැළවීමට කළ යුතු එක ම දෙය රජු ඇසුරෙන් පළා යෑම යයි සිතූ කාලිදාස මහ මගට බැස ගියේය. මෙසේ ගමන් ගත් කාලිදාස ඉතා දුර බැහැර ගමන් ගනිද්දී රෑ කාලය ගත කළේ අම්බලමකය. පසුව රජු ද වෙස්වලා ගෙන කාලිදාසයන් සොයා යද්දී එම අම්බලමෙහි ම නතරවී ඔහු හඳුනාගෙන ඇත.

එදා එහි නවාතැන් ගන්නවුන්ගේ පවස නිවා ගැන්මට උපයෝගී වන පැන් තාලියක් ද සපයා තිබුනි. නිතරම එහි පැන් පිරී තිබුණි. දිවා රෑ කවර වේලාවක වුව ද පැමිණියෙකුට පවස නිවාගැන්මට එය මහෝපකාරී විය. පැන් තාලිය පසුව පිංතාලිය ලෙසින් ද හැඳින් වූයේ එය සැපයූ අයට පින් ලැබේවා යන අරුතින් විය යුතුය. ඇතැම් තැනෙක එවැනි නටබුන් තවමත් ඉතිරිව ඇත. දුර මාපකයක් ලෙස සැතපුම නම් කෙරුනේ ද එම අරුතෙනි. දුර ගණනය කිරීමට ඉන් පෙර ගව්ව භාවිතා වී ඇති බව පෙනේ. ඕස්ට්‍රේලියාවේ නවීන පහසුකම් මධ්‍යයේ ද වාහන වලින් ගමන් ගන්නා සංචාරකයින්ගේ පහසුව තකා වුව කිලෝ මීටර සියයක දෙසියයක දුරින් විවේක ගැනීම ආහාරපාන ගැනීම ආදී අවශ්‍යතා සඳහා එවැනි විවේකාගාර ඉදි කර ඇත. එම පහසු කම සපයා ඇත්තේ එක දිගට ගමන් ගැනීම වෙහෙස කර බැවින් ද ඉන් සිදු විය හැකි අනතුරු වළකාලීම් ද වශයෙනි. සැතපුම් දහස් ගණන් මග ගෙවා රට වටා යන අයට එහි වටිනා කම නිමක් නැත. එදා අම්බලම සැපයූ සේවාව අද විවේකාගාර නැතිනම් සාව්ව'රස් සපයනු ලබයි.



ඒ අතර දියෙන් හා උඩින් ගමන් බිමන් කිරීම යම් දියුණුවක පෙර නිමිති කියා පෑවේය. යුගයෙන් යුගය කලින් කල වසරින් වසර දිනෙන් දින එදා සිට ඇතිවූ වෙනස් කම්වල ප්‍රතිඵලයන්හි හොඳක් හෝ නරකක් වේද එය අද අපට භුක්ති විඳීමට හැකියාව ලැබී ඇත.

තොටියා ඔරුවෙන් හෝ පාරුවෙන් එගොඩ සිට මෙගොඩට හෝ දිග ගමනාන්තයකට හෝ මගියා ගෙන ගියේය. තවත් යුගයක රුවල් යාත්‍රිකයා රුවල් බෝට්ටුව මුහුදු ගවේශනයට යොදා ගත්තේය. ඉනුත් මොබ්බෙහි ඊටත් දියුණු මහ නෞකාවකින් සමුදුරු තරණය මතින් දේශයන් සොයා යෑම දක්වා එය වර්ධනයට ලක් කර ඇත. එහි ප්‍රතිඵයක් ලෙස කොලොම්බස් විසින් ඇමරිකාව සොයා ගනු ලැබීමත්, කපිතාන් කුක් විසින් ඕස්ට්‍රේලියාව සොයා ගනු ලැබීමත් හැරුණු විට දේශාටනය කෙරෙහි ඇලුම් කළ වස්කෝදගාමා, මාර්කෝපෝලෝ, පාහියන්, රොබට් නොක්ස් වැන්නෝ දේශ දේශාන්තරයන් වෙත ගමන් කළහ. ඒ පිළිබඳ සටහන් තැබූහ. එසේ ම දේශාන්තරයන්හි වෙළඳ ගනුදෙනු කිරීම කෙරෙහි ද, තව දුරටත් ඒ ගමන, යුද නැව් සබ්මැරීන් වැනි අති බල සම්පන්න ජල මාර්ග යානා ලෙසින් ව්‍යාප්ත වී ඇති අයුරු ඉතිහාසය පෙන්නුම් කරයි.

අද පවතින තත්වයට ලෝකය වෙනස් කරලීමට මිනිසා දැරූ යත්නය කෙතෙක් නම් බැරෑරුම් ක්‍රියාවලියක්දැයි වෙන වෙන ම සෙවුම් බැලුම් කිරීමට අවශ්‍යතාවයක් නැත. පුරාතනයේ සිට පැවත එන මිනිසා විසින් සොයා ගනු ලැබූ හරයක් හෝ ඉටු කරනුලැබූ කිසියම් ම කුඩා වූ හෝ දැවැන්ත වූ හෝ ගවේෂණයක් නිසා බිම යා හැකි ධූම වාහනයක් ලෙස පළමු වාෂ්ප එන්ජිම නිපදවීමට ජෝජ් ස්ටීවන්සන්ට හැකි විය. අනතුරුව අහසේ පියාසර කළ හැකි ගුවන් යානයක් ද, ග්‍රහ තාරකාවන් වෙත ළඟාවීමට තරම් අධි වේගී රොකට් යානයක් ද අපේ ගමන් මග වෙනතකට යොමු කර ඇත.

අපගේ දෑස් ඉදිරියේ ඇති සෑම දෙයකින් ම දැකගත හැකි වන දෙයක් ඇත. ඒ මිනිසාගේ ගමන් මග අපූර්වත්වයට පත් කළ කඩයිම් නවීන විද්‍යාවට බොහෝ සෙයින් බරව ඇති බවය. පුරාතන යුගයකට බැර වන දේ වලත්, නවීනත්වයෙන් එළි දැක්වෙන අරුම නිමැවුම් කෙරෙහි බලපෑ සාධකත් බෙහෙවි. මෙහිදී පිම්මේ ඉදිරිය බලා දිවෙන නවීනත්වය වෙතට බඩගා පැමිණි කාලය හණමිටි යුගයක් ලෙසින් ඉතිහාසයට සැහැසි හැඳින්වීමක් දීමට ද කෙනෙක් උත්සාහ දරනු පෙනේ.

දියුණුවේ මාවත් කෙරෙහි හිත යොමු කිරීමෙහිදී අප වටා ඇති නොයෙකුත් දෑ අතර දක්නට ලැබෙනුයේ දවසින් දවස වෙනසට ලක් වන විවිධත්වයකි. මේ විවිධත්වය ක්ෂණික ව සිදුවූවක් යැයි අපට සිතිය හැකිය. එසේ සිතීමට අවකාශ ද ඇත. එහෙත් ඉතිහාසයේ පියා ලෙසින් හැඳින්වෙන හෙරඩොටස් පැවසුයේ 'අතීත මග සළකුණු අමතක කර වර්තමානය හෝ අනාගතය ද නිර්ණය කිරීම හෝ ගොඩ නැගීම අපහසු' බවය. නැතිනම් ඒ තරමට ම ඉතිහාසය හා ක්‍රමිකව බැඳී යන වෙනස් වීමක් අදට හා හෙටට පාදක වන බවය.

අද මුළු ලොව ම එක මිටට ගත හැකි තරමට සංකුචිත කර ඇත. ගමනාන්තය කොතැනද වැඩිම දුර ඇති ඒ තැනට අඩු ම දින ගණනකින් යා හැකි තරමට ගමන බිමන පහසුය. ලෝකයේ එහා කෙළවරේ වන සිදුවීම අඩු ම විනාඩි ගණනකින් නොව අඩු ම තත්පර ගණනකින් මෙහා කෙළවරේ සිටින අයෙකුට දැක බලා ගත හැකිය. ඒ තරමට ම විද්‍යාව හා තාක්ෂණය පුදුම එළවන දියුණුවකට එළඹී බව රහසක් නොවේ.

මේ වන විට සන්නිවේදන මාධ්‍යයෙහි සුන්දරත්වය ප්‍රධාන නගර අනු නගර පමණක් නොව ගම් දනව් පුරා ද විසිරී ගොස් ඇති අයුරු පුදුම එළවන සුළුය. ගුවන් විදුලිය, රූපවාහිනිය, දුරකථනය, පරිඝනකය විවිධ දාරා ඔස්සේ අද මිනිස් අවශ්‍යතා සපුරාලයි.



පුරාතනයේ සිතැගි පැවසීමට අකුරු ගල්වල ලියා තැබූහ. කල් යත් ම එය ද හැර දැමූවෝ ඒ වෙනුවට තල් පත් ඉරූ සොයා ගත්හ. ඉන් ඔබ්බට සිත් යොමු කළෝ කඩදාසි සහ උල්පත් පෑන උපයෝගී කර ගත්හ. ඉනුත් නොනැවති මේ මිනිසා මුද්‍රණ ක්‍රමයකට යොමු විය. එයින් බිහිවූ ප්‍රතිඵලය විද්‍යාවේ දියුණුව සනිටුහන් කළ අතර ඉන් දැවැන්ත පොත පත ද ලොවට එක් විය.

වැඩි ම භාෂා ගණනකට පරිවර්තනය වූ පොත ලෙස බයිබලය දැක්විය හැකිය. ඉන්දියානු සාහිත්‍යයේ වේද ග්‍රන්ථයන්ට පමණක් දෙවැනි වූ විශ්ණු ෂර්මන් පඬිවරයා විසින් රචිත පංචතන්ත්‍ර නම් ග්‍රන්ථය භාෂාවන් හැත්තෑවකට පමණ පරිවර්තනය වූ අභිරමණීය උපදේශ ග්‍රන්ථයකි. පුවත් පතක් ලෙසින් පළ වන ලොකු ම පුවත් පත පිටු 946 කින් සමන්විතය. ඒ නිව්යෝක් ටයිම්ස් පුවත් පතය. විශ්වකෝෂ ග්‍රන්ථ ද වෙන වෙනත් විවිධ ලේඛන නිමැවුම් ද විද්‍යාවත් සමග දියුණු වී ගිය සන්නිවේදන මාර්ග ලෙස දැක්විය හැකිය. ලේඛනය විවිධ පැති ඔස්සේ එම මුද්‍රණයට ඇතුලු වී වර්ණවත් ලෝකයක් එළි දක්වන්නට විය.

අද තත්වය ඊට හාත්පසින් ම වෙනස් බව සන්නිවේදන ක්‍රියාවලිය තුළ දක්නට ඇත. පරිඝණකය බිහිවීම තුළ දක්නට ඇත්තේ මිනිසා නොසිතූ තරම් ඔබ්බට දිවෙන දියුණුවක් යැයි කීවොත් නිවරදය. වසරින් වසර නව මාවත් සොයා යන පරිඝණකය ලෝකයපිළිබඳ වෙන ම වපසරියක් බවට පත්කොට ඇත. මාධ්‍යයෙහි විද්යුත් වෙබ් අඩවි තුළින් අද ඔබට අවශ්‍ය ඕනෑම තොරතුරක් සොයා ගැන්මට ගත වනු ඇත්තේ තත්පර වලින් ගිණිය හැකි කාල වකවානුවකි. අද ඔබේ අත්ලෙහි රැඳවූ ඉතා කුඩා විද්‍යුත් යන්ත්‍රයකින් එක මොහොතකින් ලොව වටා යෑමට, අවශ්‍යතා ඉටු කර ගැනීමට හෝ තොරතුරු රැස් කර ගැනීමට අවකාශ ලබාදී ඇත. මෙයින් පෙනී යන්නේ එදාට වඩා වෙනස් දියුණුවක් අද දක්නට ඇති බවය. හෙට කවර ඉසවු ඇසුරින් කවර නම් දියුණුවක් වෙත යොමු වනවා දැයි විමසිල්ලෙන් බලා සිටිය යුතු වෙමු.